

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2019

ගාලු උරුමය පදනම

காலி மரபுரிமை மன்றம்

GALLE HERITAGE FOUNDATION

බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம்,கலாச்சாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு

MINISTRY OF BUDDHASASANA , CULTURAL & REILIGIOUS AFFAIRS

GALLE HERITAGE FOUNDATION

කාර්ය සාධන වාර්තාව 2019

බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

GALLE
HERITAGE
FOUNDATION

ගාලුඋරුමයපදනම

ලිපිනය :- අංක 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.
දුරකථනඅංක :-091-2246784/ 091-2231982
ෆැක්ස්අංකය :-091-2246784
ඊමේල් :- herifo@sltnet.lk
වෙබ්අඩවිය :- www.galleheritage.gov.lk

පටුන

පිටු අංක

01.ගාලු උරුමය පදනමේ දැක්ම, මෙහෙවර සහ අගයන් 02-02

02. ගාලු උරුමය පදනම පිහිටුවීම හා ගාලු කොටුවේ භෞතික පරිසරය 03-04

03. 2019 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩලය 05-06

04.ගාලු උරුමය පදනමේ සේවය කළ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු 07-08

05. ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය 09-11

06.ගාලු උරුමය පදනමෙන් ලබාදෙන සේවාවන් 12-13

07.ගාලු උරුමය පදනම මගින් සිදු කරන ලද වැඩසටහන්

7.1. සංස්කෘතික වැඩසටහන් 14-16
7.2.දැනුවත් කිරීම හා සමාජ සුබසාධන වැඩසටහන් 17-21
7.3.සංවර්ධන වැඩසටහන් 22-31
7.4. වෙනත් ක්‍රියාකාරකම් 32 -32

08. 2019.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය 33-46

8.1 2019.12.31 දිනෙන් අවසන් වන විගණකාධිපති වාර්තාවේ පිටපත i - vi
8.2 2019 වර්ෂයේ කාර්ය සාධන පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව vii-viii
8.3 කාර්ය සාධනය වර්ධනය කරගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මාධ්‍යකාලීන ක්‍රියාමාර්ග ix-ix
8.4 අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ආයතනයට වෙනක් වැදගත් කරුණු x-x
8.5 2019 වර්ෂයේ විගණකාධිපති විමසුම් අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග xi-xxii
8.6 උක්ත වාර්තාවට පිළිතුරු යොමු කිරීමේ දී ඉදිරිපත් කල ඇමුණුම්

09. කාර්යය සාධන වාර්තාවේ දෙමළ පරිවර්ථනය 47-94
9.1 2019.12.31 දිනෙන් අවසන් වන විගණකාධිපති වාර්තාවේ දෙමළ පිටපත i - x

10. කාර්යය සාධන වාර්තාවේ ඉංග්‍රිසි පරිවර්ථනය 95-140
10.1 2019.12.31 දිනෙන් අවසන් වන විගණකාධිපති වාර්තාවේ ඉංග්‍රීසී පිටපත i - viii

01. *ගාලු උරුමය පදනමේ දැක්ම, මෙහෙවර සහ අගයන්*

දැක්ම

"2025 දී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංස්කෘතික සංචාරක පුරවරය ජීවමාන ලෝක උරුම ගාලු කොටුවයි"

මෙහෙවර

ඓතිහාසික සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා විශිෂ්ඨතම සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

අගයන්

- ගාලු කොටු පවුර හා ගොඩනැගිලි සංරක්ෂණය
- ගාලු කොටුවේ ජාතීන් අතර අන්‍යෝන්‍ය සහයෝගය හා සම්බන්ධීකරණය ඇති කිරීම
- ඓතිහාසිකත්වය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීම.
- කොටුව තුළ ජීවත්වන ව්‍යාපාරික ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීම
- කොටුව තුළ යටිතල පහසුකම් වර්ධනය කිරීම
- සංචාරක පහසුකම් ඇති කිරීම හා වැඩිදියුණු කිරීම.
- සංචාරක ආකර්ශනීය ස්ථාන ඇති කිරීම හා සංවර්ධනය කිරීම.
- ගාලු කොටුව නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ගාලු කොටුවේ ජාතීන් අතර සහයෝගිතාව හා සමානාත්මතාව වැඩිදියුණු කිරීම.
- පාරම්පරික ජීවනෝපායන් නංවාලීම.
- සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ක්‍රියාකාරකම් විධිමත් කිරීම.
- පාරිභෝගික අගයන් වැඩිකිරීම.
- කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

02.ගාලු උරුමය පදනම පිහිටුවීම හා භෞතික පරිසරය

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොටගෙන විශාල වශයෙන් රජයේ සහ මහජනයාගේ අවධානය යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා විවිධ පියවර ගනු ලැබිණ.

ඒ අනුව 1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පනත මඟින්රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ගාලු උරුමය පදනම පිහිටවනුලැබිණ.

එතැන් සිට විවිධ අමාත්‍යාංශ යටතට පත් වූ ගාලු උරුමය පදනම වර්තමානයේ නිවාස , ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ගාලු උරුමය පදනමට අයත් භූමි ප්‍රදේශය

යුනෙස්කෝ ආයතනය මඟින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගාලු කොටුව ගාලු උරුමය පදනමේ වපසරියට අයත් වේ. මුර අට්ටාල 14කින් සමන්විත මෙම කොටුවේ කොටු බැම්මේ දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 2.5ක් පමණය.



ගාලු කොටුවේ භෞතික පරිසරය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශය තුළ පිහිටි 96ඩී ග්‍රාමසේවා වසම ගාලු කොටුව අයත් ප්‍රදේශය වේ. ප්‍රමාණයෙන් අක්කර 80.9067 (හෙක්ටෙයාර් 32.7418) ක භූමි භාගයකින් ගාලු කොටුව සමන්විත වේ.

ජාතීන් අනුව ජනගහනය

සිංහල	679
දෙමළ	15
මුස්ලිම්	798
බර්ගර්	07
මැලේ	02
මුළු ජනගහනය	1501

ආගම් අනුව පවුල් සංඛ්‍යාව

බෞද්ධ පවුල්	151
හින්දු පවුල්	03
ඉස්ලාම් පවුල්	118
රෝමානු කතෝලික පවුල්	02
මුළු පවුල්	274



03.2019 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1.	චන්නදාස්වත්ත මහතා	සභාපති
2.	ඩී.කේ.එස්. ජයලක්ෂ්මි මිය	අධ්‍යක්ෂ
3.	සීතා පී. ලියනගේ මිය	පරිපාලන නිලධාරී
4.	ඩබ්.පී.ආර්.අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරී
5.	එල්.ඒ. තරංග පුෂ්ප කුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
6.	පී.ජී.එන්. චන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
7.	එස්.පී. ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
8.	බී.එස්. ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර
9.	ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙනවිය	කළමනාකරණ සහකාර
10.	මාපලගම හේවමානගේ ඉෂානි ප්‍රියදර්ශනී මිය	කළමනාකරණ සහකාර
11.	මොහොමඩ් හම්සා ෆාතිමා ෆවුසානා මිය	කළමනාකරණ සහකාර
12.	එම්.ඊ. නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා	රියදුරු
13.	එම්.එල්.එස්. ජයසේකර මයා	ආරක්ෂක නියාමක
14.	ඩබ්.ජී. නන්දන සමන් මයා	ආරක්ෂක නියාමක
15.	ඒ.ජී. සමන් කුමාර මයා	කාර්යාල කාර්ය සහයක

තනතුර	වැටුප් සංකේත අංකය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
සභාපති	පීඩී 3/2015 චක්‍රලේඛය පරිදි දීමනා ගෙවා ඇත	01	01
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී	එම්එම් 1-1	01	01
පරිපාලන නිලධාරී	ජේ එම් 1-1	01	01
ගිණුම් නිලධාරී	ජේ එම් 1-1	01	01
ව්‍යාපෘති සහකාර	එම් එන් 4	05	03
ව්‍යාපෘති සහකාර (ගිණුම්)	එම් ඒ 3	01	-
කළමනාකරණ සහකාර	එම් ඒ 1-1	04	04
රියදුරු	පී එල් 3	01	01
කාර්යාල කාර්ය සහායක	පී එල් 1	01	01
ආරක්ෂක නියාමක	පී එල් 1	04	02

ගාලු උරුමය පදනමේ කාර්ය මණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු

අනු අංකය	නම	තනතුර	සේවා කාලය
1.	චන්න දාස්වත්ත මයා	සභාපති	2019.03.01 සිට
2.	ඩී.කේ.ඒස්.ජයලක්ෂ්මි මිය	අධ්‍යක්ෂ	2019.04.29 සිට
3.	සීතා පී. ලියනගේ මිය	පරිපාලන නිලධාරී	2006.01.02 සිට
4.	ඩබ්.පී.ආර්.අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරී	2017.07.17 සිට
5.	එල්.ඒ. තරංග පුෂ්ප කුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
6.	පී.ජී.එන්. චන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
7.	එස්.පී. ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2015.04.28 සිට මේ දක්වා
8.	බී.එස්. ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2005.11.02 සිට මේ දක්වා
9.	සිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙ.වි	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.01 සිට මේ දක්වා
10.	එම්.එච්.එම්. ඉෂානි ප්‍රියදර්ශනී මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.01 සිට මේ දක්වා
11.	එම්.එච්. ෆාතිමා ෆවුසානා මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.16 සිට මේ දක්වා
12.	නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා	රියදුරු	2012.12.03 සිට මේ දක්වා
13.	ඒ.ජී. සමන් කුමාර මයා	කාර්යාල කාර්ය සහායක	2012.12.03 සිට මේ දක්වා
14.	එම්.එල්.එස්. ජයසේකර මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා
15.	ඩබ්.ජී. නන්දන සමන් මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා

04. ගාලු උරුමය පදනමේ සේවය කළ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු

ගාලු උරුමය පදනමේ සභාපති තනතුර දැරූ අයගේ තොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	රූපා කරුණාතිලක මැතිතුමා (ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය)	1994	1996
2.	නෙවිල් කනකරත්න මැතිතුමා (දකුණු පළාත් ගරු ආණ්ඩුකාර)	1996	2000
3.	ආචාර්ය රිවඩ් පතිරන මැතිතුමා	2000	2002
4.	රියෙන්සි විජේතිලක මැතිතුමා (සභාපති, හැටන් නැෂනල් බැංකුව)	2002	2003
5.	වජිර අබේවර්ධන මැතිතුමා (ගරු රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍ය)	2003	2004
6.	ජී.එච්. අජිත් කුමාර මැතිතුමා (ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී)	2004	2007
7.	පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී, ගාල්ල මහ නගර සභාව)	2007	2015
8.	රම්‍ය සිරිවංශ මැතිතුමා (විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්)	2015.02.19	2016.02.29
9.	වන්නදාස්වත්ත මැතිතුමා (වෘත්තියමය ගෘහනිර්මාණ ශිල්පී)	2016.04.07	2018.10.26
10.	වන්නදාස්වත්ත මැතිතුමා (වෘත්තියමය ගෘහනිර්මාණ ශිල්පී)	2019.03.01	මේ දක්වා

- 2018/10/27 – 2019/02/28 සභාපති ධුරය

2018/10/26 වන දින රටේ පැවති දේශපාලන වාතාවරණය වෙනස්වීම මත ගරු සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාව සිටි එස්.බී.නාවින්න මැතිතුමා විසින් ගාල්ල නාගරික මන්ත්‍රී ගරු පරාක්‍රම දහනායක මැතිතුමා සභාපති ලෙස යෝජනා කළ ද එවකට ගරු අධිකරණයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත අතුරු තහනම් නියෝගය නිකුත් කිරීම හේතුවෙන් එම පත් කිරීම් පිළිබඳ යම් අවිනිශ්චිත තාවයක් ඇතිවිය. ඒ අනුව ගාලු උරුමය පදනමේ 2018/10/27 සිට 2019/02/28 දිනතෙක් සභාපති ධුරය හෙබවීම සඳහා කෙනෙකු පත් කලේ නැත.

ගාල්ල උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරය දැරුවන්ගේ කොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	පී. හේවාවසම් මහතා (හිටපු දිසාපති, ගාල්ල)	2001.12.15	2004.04.01
2.	පී. විජේරත්න මහතා (හිටපු අතිරේක දිසාපති, ගාල්ල)	2004.06.28	2005.12.31
3.	එස්.ඕ.එන් ද සිල්වා මහතා (හිටපු ප්‍රාදේශීය කළමනාකරු ලංකා බැංකුව)	2006.01.12	2007.02.28
4.	එච්.එල්. ගුණවර්ධන මහතා (හිටපු ප්‍රාදේශීය ලේකම්, ගාල්ල කඩවත්සතර)	2007.04.11	2018.04.20

ගාල්ල උරුමය පදනමේ පරිපාලන නිලධාරී තනතුර දැරූ අයගේ කොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	හේමනාත් ගුණවර්ධන මහතා	2001.03.01	2003.10.31
2.	පී.ඒ. කරුණාසේන මහතා	2004.03.25	2005.12.31
3.	සීතා පී. ලියනගේ මහත්මිය	2006.01.02	මේ දක්වා

05. ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය

ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය පදනමේ පනත මගින් "කළමනාකරණ මණ්ඩලය"වෙත පවරනු ලැබ ඇත. (පණතේ 05 වන වගන්තිය පරිදි)

ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

අනු අංකය	තනතුර	ලිපිනය
1.	දිස්ත්‍රික් ලේකම් (උප සභාපති -ගාලු උරුමය පදනම)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල
2.	පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
3.	සභාපති නාගරික සංවර්ධන අධිකාරිය	නාගරික සංවර්ධන අධිකාරිය, අංක 07, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4.	සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරිය	ශ්‍රී ලංකා වරාය අධිකාරිය, චෛත්‍ය පාර, අංක 19, කොළඹ 01.
5.	අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල	මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
6.	අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 04 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.
7.	ප්‍රාදේශීය ලේකම් කඩවත්සතරප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කඩවත්සතරප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වක්වැල්ල පාර, ගාල්ල.
8.	ගරු නගරාධිපති මහ නගර සභාව	මහ නගර සභාව, කළුවැල්ල පාර, ගාල්ල.
9.	අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
10.	සභාපති, ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා)	ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා), කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15.
11.	අධ්‍යක්ෂ ස්මාරක සංරක්ෂණය පිළිබඳ වාස්තු විද්‍යා අධ්‍යයන අංශය	වාස්තු විද්‍යා අධ්‍යයන අංශය, මොරටුව විශ්ව විද්‍යාලය, මොරටුව.
12.	දකුණු පළාත් සංස්කෘතික අමාත්‍ය	දක්ෂිණ පාය, ලබුදුව, ගාල්ල.
13.	අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
14.	සභාපති, ශ්‍රී ලංකා නෙදර්ලන්ත මිත්‍රත්ව සංගමය	ශ්‍රී ලංකා නෙදර්ලන්ත මිත්‍රත්ව සංගමය, අංක 95, කුමාර වීදිය, කොළඹ 11.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්:-

නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් තෝරාපත්කර ගන්නා ලද "තෝරාපත් කළ සමාජිකයන්"

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය
15.	ආචාර්ය නිලාන් කුරේ මහතා	වරලත් වාස්තු විද්‍යාඥ	නො.111/1, ද මැල් පාර, කටුබැද්ද, මොරටුව.	2017.07.28
16.	එච්.ඩබ්. විජේරත්න මහතා	සභාපති දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව	06 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල.	2017.07.28
17.	ලේකම් ජනරාල්	ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව	ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 05 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල	2017.07.28
18.	චන්දන අලහකෝන් මහතා	නියෝජ්‍ය පොලිස්පති , ගාල්ල දිසාව	නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය, කොටුව, ගාල්ල	2017.07.28
19.	ඩබ්.යූ.පී.ප්‍රේමචන්ද්‍ර මහතා	ආණ්ඩුකාර ලේකම්	ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, පහළ ඩික්සන් පාර , ගාල්ල	2018.08.30
20.	ජයතිස්ස හේරත් මහතා	සභාපති, අයිකොමස් ශ්‍රී ලංකා ආයතනය	නො. 317/3, වැකන්ද පාර, හබරකඩ, හෝමාගම	2017.07.28

අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය
21.	වන්න දාස්වත්ත මහතා	සභාපති ගාලු උරුමය පදනම	නො 48/3, පූජ්‍ය ශ්‍රී ධර්මරත්න මාවත, මාදිවෙල.	2019.02.07 දින සිට *(2019.03.01 දින සිට ගාලු උරුමය පදනමේ සභාපති ධුරය පත්වන ලදී)*
22.	කේ.එම්.ජී.ලිලානන්ද ඛයස්මහතා	පත්කල සාමාජික	පුංචි ලබුදුව, ගාල්ල	2019.02.07 දින සිට මේ දක්වා
23.	ජී.ඩී.ආර්.උපුල් උදය කාන්ත මහතා	පත්කල සාමාජික	38/2 බී වැකුනුගොඩ, ගාල්ල	2019.02.07 දින මේ දක්වා
24.	ඩී.සී උදයංග පීරිස් මහතා මහතා	පත්කල සාමාජික	33/47 සී තුන්වන පටුමග, හේනවත්ත මීගොඩේ.	2019.02.07 දින සිට මේ දක්වා
25.	එම්.වී.චන්ද්‍රසිරි මහතා	පත්කල සාමාජික	ලියනගේවත්ත, පහල ලේල්වල, වඳුරඹ. ගාල්ල.	2019.02.07 දින සිට මේ දක්වා
26.	රවීනද්‍ර කලංසූරිය මහතා	පත්කල සාමාජික	504/5 හිරිඹුර පාර ගාල්ල	2019.02.07 දින සිට මේ දක්වා

කළමනාකරණ මණ්ඩලයේ සංයුතියේ සිදු වූ වෙනස්කම්.

ගාලු උරුමය පදනමේ කලමණාකරණ මණ්ඩලය සඳහා පනතේ 06(ආ) IIප්‍රකාරව "තෝරා පත්කළ සාමාජිකයන් " පත් කිරීම 2019.08.22 පැවැති කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී සිදු විය. ඒ අනුව පහත සඳහන් සාමාජිකයන් 6 දෙනා " තෝරා පත්කළ සාමාජිකයන්" ලෙස නැවත තේරී පත් විය.

I. එච්.ඩබ්.විජයරත්න මහතා (සභාපති, රාජ්‍ය කොමිසන් සභාව)
II. නුවන් වෙදසිංහ මහතා (නියෝජ්‍ය පොලිස්පති,ගාල්ල දිසාව)
III. ආචාර්ය නිලාන් කුරේ මහතා (වරලත් වාස්තු විද්‍යාඥ)
IV. ජයතිස්ස හේරත් මහතා (වරලත් වාස්තු විද්‍යාඥ)
V. ප්‍රේමලාල් රත්නසිරි මහතා (ලේකම් ජනරාල්, ශ්‍රී ලංකා යුනෙස්කෝ කොමිෂන් සභාව)
VI. ඒ .යූ.වේලාරත්න මහතා (දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්)

06. ගාලු උරුමය පදනමෙන් ලබාදෙන සේවාවන්

1. ගාලු කොටුව තුළ සංචාරක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
2. ගාලු කොටුව අලංකාරවත්ව පවිත්‍රව පවත්වාගෙන යාම.
3. ගාලු කොටුව තුළ ගොඩනැගිලි තැනීම, වෙනස් කිරීම කළමනාකරණය කිරීම සඳහා ගාලු කොටුව සැලසුම් කමිටුව සමඟ කටයුතු කිරීම.
4. ගාල්ල කොටුව පිළිබඳ දැනුවත් කිරීමේ දේශන හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
5. ගාල්ල කොටුව තුළ ජංගම වෙළඳාම විධිමත් කිරීම.
6. ගාලු කොටුවතුළට අවශ්‍ය රථවාහන සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
7. ගාල්ල කොටුවතුළ ජංගම ආරක්ෂක සේවාවක් පවත්වාගෙන යාම.
8. ගාල්ල කොටුව පිළිබඳ තොරතුරු ලබාගතහැකි තොරතුරු කේන්ද්‍ර (තොරතුරු මධ්‍යස්ථානය) පවත්වාගෙන යාම
9. වර්ෂය පුරා සංස්කෘතිකමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
10. ගාලු කොටුවතුළ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
11. ගාලු කොටුවතුළ රූගත කිරීම් කළමනාකරණය කිරීම.
12. ගාලු කොටුව තුළ සියළුම පැරණි ගස් වල අතු උද්භිත උද්‍යාන උපදේශනාත්මකව කප්පාදු කර නඩත්තු කටයුතු කිරීම
13. ගාලු කොටුව තුළ පිහිටි පැරණි ගොඩනැගිලි 6 ක් සංරක්ෂණය කිරීමට අවශ්‍ය සංරක්ෂණ සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය කටයුතු කිරීම.
14. ටොන් 5 ට වැඩි බර වාහන කොටුවට ඇතුළු කිරීම නතර කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
15. ගාලු කොටුව තුළ ඇති වීදි ලාම්පු චෝගම් විදුලි පද්ධතිය නවීකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
16. සඳු අට්ටාලය ළමා කෞතුකාගාරයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම

ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානයෙන් ලබාදෙන සේවාවන්

ගාල්ල කොටුව බාලදක්ෂ මාවතේ පිහිටි ගාලු උරුම කේන්ද්‍රය (තොරතුරු මධ්‍යස්ථානය) 2019 මාර්තු මස 21 වන දින සංරක්ෂණයෙන් පසු නැවත විවෘත කරන ලදී.

ගාලු උරුම කේන්ද්‍රය (තොරතුරු මධ්‍යස්ථානය) විවෘත කිරීමෙන් පසුව 2019 වර්ශයේ දී සිදු කළ සේවාවන් පහත දැක්වේ.

- දේශීය හා විදේශීය පිරිස් වෙත කොටුවේ තොරතුරු ලබාදීම.
- කොටුවේ ක්ෂේත්‍ර චාරිකා සූදානම් කිරීම හා මාර්ගෝපදේශන සේවාවන් ලබාදීම.
- පොත්පත් අලෙවිය ආදී කටයුතු සිදු කරන ලදි.



7.ගාලු උරුමය පදනම මඟින් සිදු කරන ලද වැඩසටහන්

7.1. සංස්කෘතික වැඩසටහන්

නව වසර සැමරීම (2019 .01.01)

2019 වසරේ ජනවාරි 01 වන දින රාජකාරී කටයුතු ආරම්භයට ප්‍රථමව, කාර්යාලයේ සියලුම නිලධාරීන් හා සහෝදර ආයතන නිලධාරීන්ගේ ද සහභාගීත්වය ඇතිව ආගමික වතාවත්වල යෙදෙමින් සෙත්පිරිත් සජ්ඣායනයක් ශ්‍රවනය කර එහි ආශිර්වාද ලබාගෙන සියලු දෙනා එක්ව කැවිලි පෙවිලිවලින් යුතු සංග්‍රහයක් භුක්තිවිඳ සතුටින් සාමයෙන් සුහදව රාජකාරී කටයුතු ආරම්භ කරන ලදි. මෙය ගාලු උරුමය පදනම විසින් කරනු ලබන සංස්කෘතිකමය වැඩසටහනක් වන අතර, සියලු පිරිවැය දරනු ලබන්නේ නිලධාරීන් වීම විශේෂ වේ.







<u>වෙසක් උත්සවය</u>

2019.05.18 සහ 19 යන දෙදින සිංහල බෞද්ධ ජනයාගේ ආගමික වශයෙන් වැදගත්වන වෙසක් පොහොය නිමිත්තෙන් ගාලු නගරය වෙත ඇදෙන විශාල පිරිසකට ගාලු නගරයේ පෞඩත්වය විදහාපාන ඓතිහාසික ලෝක උරුම ගාලු කොටු පවුර ආලෝකමත් කිරීම සඳහා රු:75,000.00ක මුදලක් වැය කර අලෝකමත් කරන ලදී.



එමෙන්ම ගාලු කොටුවේ ප්‍රධාන කාර්යාලය සහ තොරතුරු කෙන්ද්‍රය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වෙසක් කූඩු වලින් ආලෝකමත් කරන ලදී.





පොසොන් උත්සවය

පොසොන් පොහොය නිමිත්තෙන් 2019.06.16 දිනයේ සිට 2019.06.18 දින තෙක් කොටු පවුර ආලෝකමත් කිරීම සඳහා රු. 75,000.00 ක මුදලක් වැය කරන ලදී.







7.2 <u>දැනුවත් කිරීම් සහ සමාජ සුභ සාධන වැඩසටහන්</u>

<u>දැනුවත් කිරීම්වැඩසටහන්</u>

දේශීය නියෝජිතයන් දැනුවත් කිරීම

2019/01/28 වන දින සහ 2019/05/22 යන දින මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සැලසුම් අධ්‍යන අංශයේ දේශීය හා විදේශීය සිසුන් හා ඔවුන්ගේ ආචාරවරුන් සමඟ පිරිස් 60 ක පමණ කණ්ඩායමක් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීම.



2019/04/02 දින බදුල්ල මුතුමාල විද්‍යාලයේ සිසුන්, දෙමව්පියන් සහ ආචාර්යවරුන් 100 ක පමණ කණ්ඩයමක් සඳහා මාර්ගෝපදේශනයක් ශිරංග ජයසේකර මහතා විසින් සිදු කරන ලදී.





එසේම 2019/04/02 සහ 03 වන දින ගාල්ල මවුන්ට් කැල්වරි උසස් පාසලෙහි 07 වන සහ 08 වන ශ්‍රේණිවල ළමුන් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් ශිරංග ජයසේකර මහතා විසින් සිදු කරන ලදි.







විදේශිය නියෝජිතයන් දැනුවත් කිරීම

2019/01/19 වන දින දකුණු අප්‍රිකානු මහ කොමසාරිස් වන රොබීනා මහත්මිය ගාලු කොටුව සංචාරය කරන ලද අතර ඇයට ගාල්ල කොටුව පිළිබඳ දැනුම්වත් කිරීමක් කරන ලදී.





<u>අප්‍රිකානු කලා ප්‍රසංගය (2019.04.09)</u>

ගාලු උරුමය පදනම සහ රුහුණු සංචාරක කාර්යාංශය විසින් සංවිධානය කරන ලද අප්‍රිකානු සම්භවයක් සහිත සිරම්බිඅඩි හි වෙසෙන ශ්‍රී ලාංකීය ජන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන කලා ප්‍රසංගය ඔරලෝසු කණුව ඉදිරිපිට පිහිටි එළිමහන් පරිශ්‍රයේදී පැවත්වන ලදී.




සමාජ සුභ සාධන වැඩසටහන්

ගාල්ල කොටුවේ ප්‍රදීපාගාරය ඉදිරිපිට වෙරළ තීරය ඉතා අපවිත්‍ර වී වල් ගස් වැවී තිබූ අතර ගාල්ල පොලීසිය, නාවික හමුදාව සහ යුධ හමුදාවේත් සහභාගීත්වයෙන් ශ්‍රමදානයක් සංවිධානය කර වෙරළ පිරිසිදු කිරීම සහ එම වෙරළ තීරයේ පවතින කොට්ටම්බා ගස් වල දිරාපත්ව තිබූ ගස් වල අතු ආකර්ෂණීය අයුරින් කපා දැමීම 2019/01/26 වන දින සිදු කරන ලදී.







ගාල්ල කොටුවේ කොඩිගල අසළ කොටු බැම්මට පහලින් තිබූ මූදිල්ලා ගස් 02 ක් අකුණු සැර වැදීමෙන් මිය යෑමට ලක්වුණි. මෙම ප්‍රදේශය ආශ්‍රිතව දෙස් විදෙස් සංචාරකයින් බහුලව ගැවෙසෙන බැවින් එම ගස් දෙක ඉවත් කිරීම සිදු කළ යුතුව තිබූ බැවින් එම ගස් දෙක 2019/01/25 වන දින ගාලු උරුමය පදනම විසින් රු. 13,000/- ක් වැය කොට ඉවත් කරන ලදී.

උද්භිත නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ගාල්ල කොටුවේ රෝහල් වීදියේ ලංකා බැංකුව ඉදිරිපිට තිබෙන මාර ගසෙහි අතු පැස්සීම රු. 38,000/- ක් වැය කොට සිදු කරන ලද අතර ඉදිරියට මෙම මාරගස් නඩත්තු කරන ආකාරය පිළිබඳව ගාලු උරුමය පදනමේ නිළධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

ජාතික පරිසරය සැමරුම් සතිය

- ගාල්ල කොටුවේ ප්‍රදීපාගාරය ඉදිරිපිට වෙරළ තීරය 2019.06.08 දින ගාලු උරුමය ප්‍රමුඛව ශ්‍රමදානයක් සිදු කරන ලදි.




- ජාතික සැමරුම් සතිය නිමිත්තෙන් ගාලු කොටුවේ රුක්රෝපණ වැඩසටහනක් දියත් කරන ලදී.





- කාර්යාලය පරිශ්‍රය තුළ ගෙවතු වගාව සිදු කිරීම



7.3සංවර්ධන වැඩසටහන්

- *බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන - VIII අදියර*

  (2019.10.05 සිට 08 දක්වා)

බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහනෙහි VIII අදියර 2019-10-05 දින සිට 08 දින දක්වා යාපනය දිස්ත්‍රික්කය කේන්ද්‍රීය කරගෙන පවත්වන ලදී.මෙම අදියර සඳහා ගාල්ල - යාපනය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් පාසල් 5කින් ළමුන් 25 ක්ද ගුරුවරු 05 ක් ද යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ළමුන් 25ක් හා ගුරුවරු 05 ද සහභාගි විය. එසේම මෙම වැඩසටහන සඳහා ජාතික සමගි සංහිඳියා කාර්යාංශයේ අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ(පාලන) ජේ. කේ. රාජපක්ෂ මහතා, ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ ඩී. කේ. එස්. ජයලක්ෂ්මී මැතිනිය,දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ මනෝජ් පද්මලාල් මහතා, උතුරු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ එස්. උදයකුමාර් මහතා, යාපනය කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්. සන්දර රාජා මහතා, යාපනය සහකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දර්මිකා මහත්මිය, යාපනය සංගම් අධ්‍යක්ෂ ජේ. බාලසිංහම් මැතිණිය, නල්ලූර් කළාප අධ්‍යාපන නිලධාරී F.X.ඇන්ටන් මහතා සහ ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩල නිලධාරීන් ද ඇතුළුව ජාතික සමගි සංහිඳියා කාර්යාංශයේ සම්පත් දායක නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ද සිදු විය.







යාපනයෙහි පණ්ඩතර්ප්පු පිහිටි රිට්ටි හවුස් නේවාසිගාරයේ නේවාසිකව සිටිමින් වැඩසටහන මෙහෙයවීම සිදු කරන ලදී.

මෙම වැඩසටහනේදී දඹකොළ පටුන,යාපනය බලකොටුව,නාගදීප මහා විහාරය, යාපනය පුස්තකාලය, කඳුරුගොඩ/කන්තරෝදය පුරාවිද්‍යා භූමිය, නල්ලූර් කන්දසාමි කෝවිල වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීම සහඑම ස්ථාන පිළිබඳ ඓතිහාසික තොරතුරු පිලිබඳ විස්තර පැහැදිලි කිරිමද සිදු විය. එමෙන්ම යාපනය මහ නගර සභාව නැරඹීම හා නගරාධිපති එමානුවල් ආනෝල්ඩ් මහතාගේ සුභඳ පිළිගැනිමත් යාපනය පොලිස් මූලස්ථානය නැරඹීම හා මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේද සුභඳ පිළිගැනිමත් සහ යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුකාර කාර්යාලය සංවිධානය කර තිබූ මාර්ග නීති ප්‍රතිඥා වැඩසටහනට සහභාගි වීම හා ආණ්ඩුකාර සූරේන් රාගවන් මැතිතුමාගේ සුභඳ පිළිගැනිමත් මෙහිදී වූ විශේෂ සිදු වීම් වේ.

වැඩසටහනෙහි සෑම දිනකම සියලුම සිසුන්ට උදෑසන ශාරීරික ව්‍යායාම් වැඩසටහන් ද සිදු කරන ලදී.එමෙන්ම උතුර දකුණ සංහිඳියාව ඇති කෙරෙන සහෝදරත්වය වර්ධනය කරනු වස් විවිධ ක්‍රියාකාරකම් වැඩසටහනට අන්තර්ගතව සිදු කෙරිණි. වැඩසටහනෙහි අවසාන දින විසිර යාමේ උත්සවයේදී සංස්කෘතික ප්‍රසංගයක් හා සහභාගි වූ සියලුම සිසු සිසුවියන් හා ගුරු භවතුන්හට සහතික පත් සහ පාසල් සඳහා ත්‍යාගද පිරිනමන ලදී.

මෙලෙසින් බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන VIII අදියර සාර්ථකව නිමාවිය. මෙම වැඩසටහන සඳහා රු.557,846.28 මුදලක් (දළ වශයෙන්) වැය කරන ලදී.

- ***<u>ගාලු උරුමය පදනමේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.</u>***

ගාලු උරුමය පදනම සඳහා තිබූ යල්පැන ගිය සරල වෙබ් අඩවිය වෙනුවට වඩාත් කාර්යක්ෂම ලෙස සේවාවන් ලබා ගැනීමට හැකිවන ලෙස වෙබ් අඩවිය සංවර්ධනය කර නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සිදු විය. ගාලු කොටුවෙහි ඇති විශ්වීය වටිනාකම සහ ඓතිහාසික වැදගත් කම පිළිබඳ තොරතුරු සියලු ජනතාව වෙත ලඟා කරමින් ගාලු උරුමය පදනමේ සේවාවන් වඩාත් කාර්යක්ෂම ලෙස සේවාලාභීන් වෙත ලබා දීමත් අපේක්ෂාවෙන් නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී.

ඒ අනුව වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ආයතනය ලෙස Bellvantage (pvt) Ltd ආයතනය කටයුතු කරන ලදී. වෙබ් අඩවියට ඇතුලත් කල යුතු තොරතුරු ගාලු උරුමය පදනමෙන් ලබා දෙන ලදී. වෙබ් අඩවිය නිර්මාණයට අදාළ තාක්ෂණික උපදේශකත්වය ලබුදුව,ප්‍රධාන අමාත්‍යාංශයේ පරිගණක වැඩසටහන් සම්පාදක පි.ඒ.සජීවනි මහත්මිය විසින් සිදු කරන ලදී.

නිල වෙබ් අඩවිය තෙහාෂාවෙන් තොරතුරු ඇතුලත් කර නිර්මාණය කිරීම අවසන් කරමින් 2019.03.29 දින ජනතාව වෙත විවෘත කිරීම ගාලු උරුමය පදනමේ කළමණාකරණ මණ්ඩලයේ සහභාගිත්වයෙන් සභාපති,වරලත් වාස්තු විද්‍යාඥ වන්න දාස්වත්ත මහතාගේ සුරතින් සිදු විය.



වෙබ් අඩවිය වෙත වෙබ් servers පහසුකම ලබා ගැනීම ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණික නියෝජිත ආයතනය (ICTA) සමඟ එක්ව සිදු කරන ලදී. වෙබ් අඩවිය නිර්මාණය කිරීම සඳහා රු.497,765.00 (දළ වශයෙන්) මුදලක් වැය කරන ලදී. www.galleheritage.gov.lkයන වෙබ් ලිපිනය ඔස්සේ නිල වෙබ් අඩවිය සාර්ථක ලෙස ක්‍රියාත්මක විම සිදු වේ.







- *<u>ලෝක උරුම ගාලු කොටුව නැරඹීමට පැමිණි සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.</u>*

<u>වැසිකිළි පද්ධති නවීකරණය කිරීම</u>

I. ලංකාවේ ලෝක උරුම අතුරින් ප්‍රශස්ත අගයන් සහිත ගාල්ල කොටුව නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයෝ විශාල ප්‍රමාණයක් පැමිණෙති. එලෙස පැමිණෙන නරඹන්නන් ගණන සීඝ්‍රව ඉහල යන නිසා ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා අදියර කිහිපයක් ඔස්සේ විශේෂ ව්‍යාපෘතියක් ගාලු උරුමය පදනම විසින් ක්‍රියාත්මක කරමින් පවති. ඒ යටතේ ගාල්ල කොටුව බාලදක්ෂ මාවතේ පිහිටි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම ආරම්භ කරන ලදි. දැනට වර්ෂ ගණනාවකට කලින් මෙම වැසිකිළි පද්ධතිය ඉදිකර තිබූ අතර ගාල්ල මහ නගර සභාව විසින් නඩත්තු කටයුතු කර ගෙන යනු ලැබීය .

එසේ වුවත් වැසිකිළි පද්ධතිය අබලන්ව පැවතීම නිසා දෙස් විදෙස් සංචාරකයන් සඳහා මෙය භාවිතා කිරීම අපහසු මට්ටමක පැවතුණි.එසේම කොටු බැම්ම ආසන්නයේ මෙම වැසිකිළි පද්ධතිය ඉදිකර තිබූ අතර ගොඩනැගිලි වල වාස්තු විද්‍යාත්මක හැඩය ඉපැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලට නොගැලපෙන බව හඳුනා ගන්නා ලදී.ඒ අනුවදිරා ගිය මෙම වැසිකිළි පද්ධතිය සම්පූර්ණයෙන් ඉවත් කළ අතර දෙස් විදෙස් සංචාරකයින්ට ගැලපෙන ආකාරයෙන් වඩාත් නවීන තාක්ෂණික පහසුකම් සහිතව ගාල්ල කොටුවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට ගැලපෙන පරිදි නව වැසිකිළි පද්ධතියක් ඉදිකරනු ලැබීය. එම වැසිකිළි පද්ධතිය ආබාධිත පුරවැසියන්ටද පහසුකම් සලස්වා සකස් කර ඇති අතර 2019 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමට ලැබුණු ප්‍රාග්ධන මුදලින් රු.6,149,670 වැය කර සංවර්ධනය කරන ලදි.

මෙම ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීම සහ වාස්තු විද්‍යාත්මක උපදෙස් ගාලු උරුමය පදනමේ සභාපති වරලත් වාස්තු විද්‍යාඥ චන්න දාස්වත්ත මහතා විසින් නොමිලේ ලබා දුන් අතර ඉංජිනේරුමය උපදෙස් ලබා දීම හා අධික්ෂණ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ලබා දෙන ලදී







II. උක්ත වැඩසටහන යටතේ තවත් වැසිකිළි පද්ධතියක් ගාල්ල කොටුව පල්ලිය විදිය හි පිහිටි පැරණි පොලිස් නිල නිවාස පද්ධතියේ යාබඳ කොටසක සම්බන්ධ කරනු ලැබිය. පැරණි පොලිස් නිල නිවාසය ගොඩනැගිල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් තුමිය විසින් සුදුසු පසු භාවිතයන් උදෙසා යොදා ගැනීම සඳහා 2019 වර්ෂයේ මැද භාගයේදී ගාලු උරුමය පදනමට ලබා දෙනු ලැබීය. එම පරිශ්‍රය පිටුපස එම ගොඩනැගිල්ල භාවිතා කරන පොලිස් නිලධාරින් විසින් ඉදිකරනු ලැබූ වැසිකිළි පද්ධතියක් තිබූ අතර එම වැසිකිළි පද්ධතිය කෙටි කාලීන භාවිතයක් උදෙසා ගාලු උරුමය පදනම විසින් සංවර්ධනය කරනු ලැබීය. එම ව්‍යාපෘතිය සඳහා රු. 1,152,103.19 මුදලක් වැය කරනු ලැබීය.

ව්‍යාපෘති උපදේශක නිවස ගාල්ල දිස්ත්‍රික් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අතර ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරනු ලැබීය.

III. සුරක්ෂිත සංචාරක පරිශ්‍රයක් ගාලු කොටුව තුල නිර්මාණය කිරීම

ගාලු කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ සහ කොටුව තුල ජීවත් වන පුරවැසියන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ගාලු උරුමය පදනමේ අවධානය යොමු කරනු ලැබීය. ඒ යටතේ ගාලු කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් ගාල්ල කොටුව තුල වැඩි කාලයක් රඳවා ගැනීම අරමුණු කරගෙන සක්‍රීය සංචාරක පරිශ්‍රයක් බවට ගාල්ල කොටුව පත්කරගෙන ප්‍රදේශයට ලැබෙන ආදායම තර කර ගැනීම මෙහි අරමුණ විය.1980 දශකයේ ගාලු කොටුව විවිධ ස්ථානවල සවි කරනු ලැබූ ඉපැරණි හැඩයේ විදී ලාම්පු 156 සම්පූර්ණයෙන් ම අලුත්වැඩියා කරනු ලැබීය. මේ සඳහා රු.1,434,679.86 මුදලක් වැය කරනු ලැබීය.මෙම ව්‍යාපෘතියේ උපදේශකත්වය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කරනු ලැබීය.

එම විදී ලාම්පු නඩත්තු කර පවත්වාගෙන යාමට ගාල්ල මහ නගර සභාවට භාරදෙන ලදී.






- <u>ගාලු කොටුවේ භූමි නඩත්තු හා පවිත්‍රතා කටයුතු කිරීම.</u>

සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කෙරෙන ලෝක උරුම ගාලු කොටුව ප්‍රේද්ශයේ නඩත්තු කටයුතු යටතේ තණකොළ කැපීම හා කොටු පවුර වටා ඉවත ලන අපද්‍රව්‍ය ඉවත් කිරීම් වශයෙන් කාර්යයන් දෙකක් ඉටු කරනු ලබයි.

මෙහිදි ප්‍රසම්පාදන කටයුතු මගින් තණකොළ කැපීම් කළාප දෙකක් වශයෙන් බෙදා කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකු යටතේ මසකට වරක් වශයෙන් තණකොළ කපා නඩත්තු කිරීමේ කාර්යයන් සිදු කරනු ලබයි.මේ සඳහා මසකට රු.167,500.00 ක මුදලක් වෙන්කරනු ලබයි.

කොටුව වටා දෛනිකව ඉවත ලන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා දෛනික වැටුප් මත කම්කරුවෙකු යොදවා පවිත්‍ර කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. මේ සඳහා කොටුව වාසීන් මූල්‍යමය දායකත්වය ලබා දීම කරනු ලබයි.

- <u>*ගාලු කොටුවේ ගොඩනැගිලි සංරක්ෂණය කිරීම*</u>

ගාලු කොටුවේ ගොඩනැගිලි සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළමු අදියරයේ දී සිදු කළ යුතු ගොඩනැගිලි 06 ක් මෙම වර්ෂය සඳහා සංරක්ෂණයසැලසුම් සකස් කිරීම සිදු විය. ඒ සඳහා රු. 2,789,174.53 ක් මුදලක් වැය විය.

➢ මහේස්ත්‍රාත් නිල නිවස සහ ගාලු උරුමය පදනම කාර්යාලය

හමුදා කඳවුරට යාබඳව පිහිටි වර්තමාන මහෙස්ත්‍රාත් නිල නිවස 17 වන සියවසේ ඉදි වූ සුවිශේෂ ගොඩනැගිල්ලකි. 19 වන සියවසේ මිනින්දෝරු සිතියමෙහි නිලධාරීන්ගේ නිල නිවාස (officers Quaters) ලෙස භාවිතා කළ බවට සටහන් කර ඇත. පසුකාලීනව මහෙස්ත්‍රාත් නිල නිවාස බවට සංවර්ධනය කරනු ලැබීය. ලන්දේසී පාලන සමයේ (courie des BufflesOccuperponartillerie) කාල තුවක්කු රෙජිමේන්තුවේ වෙඩි බෙහෙත් සහ ආයුධ ගබඩා කිරීම සඳහා මෙම ගොඩනැගිල්ල ඉදි කරනු ලැබීය. නිලධාරීන්ගේ නිල නිවස ලෙස භාවිතයට ගැනීම සඳහා මෙහි තිබූ වෙඩි බෙහෙත් ගබඩාවේ පරිසරය වෙනස් කරමින් ජනේල් සහ දොරවල් නිර්මාණය කරමින් මිනිස් වාසයට සුදුසු පරිසරයක් සැකසෙන පරිදි ඉදිකිරීම් වෙනස් කරනු ලැබූ බව සිතිය හැකිය. බ්‍රිතාන්‍ය අවධියේ ස්වකීය දෙවන ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුව විසින් ද මෙම ගොඩනැගිල්ල භාවිතා කරනු ලැබීය. වර්තමානයේ මෙම ගොඩනැගිල්ල ගාලු උරුමය පදනම විසින් ප්‍රධාන කාර්යාලය ලෙසත්, මහෙස්ත්‍රාත්නිල නිවාසය ලෙසත් භාවිතයට ගනු ලැබේ.



➢ පල්ලිය වීදියේ පොලිස් නිල නිවස

බ්‍රිතාන්‍ය පාලන සමයේ නිල නිවාස ලෙස භාවිතා කරන ලද ගොඩනැගිල්ල වේ. මෙම ගොඩනැගිල්ල 19 වන ශත වර්ෂයේ මුල් භාගයේ දී ඉදි කරනු ලැබූ බව එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට අනුව හඳුනා ගත හැක. ඕලන්ද පාලන සමයේ මෙම ස්ථානයේ ගොඩනැගිල්ලක් පිහිටා තිබුණු බව දක්නට නොලැබෙන නිසා මෙම ගොඩනැගිල්ල බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදිකරනු ලැබුවක් බව නිගමනය කළ හැකිය.ඒ අනුව ගොඩනැගිල්ලෙන් පිළිබිඹු වන වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අනුව 19 වන සියවසේ ලක්ෂණ ලෙස හඳුනාගත හැකිය.බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙහි කම්කරු අධික්ෂකයන්ගේ නිල නිවාස ලෙස භාවිතා කරන ලදී.



➢ මාර්ග සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල

බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙම ගොඩනැගිල්ල පොලිස් පරීක්ෂකගේ නිල නිවාසය ලෙසට භාවිතා වී ඇත. මෙම ගොඩනගිල්ල දිගු ඉතිහාසයක් සහිත වටිනා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලින් සමන්විත ගොඩනැගිල්ලකි. මූල පරාල වහලක් සහිත ගොඩනැගිල්ලක් වන මෙහි ඉදිරිපස සහ පිටුපස ආලින්ද දෙකක් දක්වට ලැබීම විශේෂ වේ. වර්තමානයේ පිටුපස ආලින්ද කොටස් බිත්ති මගින් ආවරණය කර ඇත. වර්තමානයේ දී මෙම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාවිතයට ගනු ලැබේ.



➢ රෝහල් වීදියේ පොලිස් සේවාසථ පුහුණු ඒකක සමඟ ගොඩනැගිලි 03 ගෙඩනැගිලි තුනකින් සමන්විතය. ඒ අනුව ,

- යුධ හමුදා ආපන ශාලාව
  පැරණි සිතියම් පරීක්ෂා කිරීමේ දී ලන්දේසි සිතියම්වල සටහන් වී ඇති ගොඩනැගිල්ලක් ලෙස හඳුන්වාදිය හැක. එසේම මැටි හුණු වැලි සහ කොරල් භාවිතයෙන් ඉදිකර ඇති නිසා ද ලන්දේසි අවධියේඉදිකරනු ලැබූ බව පැහැදිලි වේ. 1844 වර්ෂයේ ගාල්ල කොටුවේ පොලිසිය වෙනුවෙන් භාවිතා වන්නට විය. වර්ථමානයේ මෙම ගොඩනැගිල්ල පොලිස් අපරාධ විමර්ශන ඒකකය ලෙස පවත්වාගෙන යනු ලැබේ.



- පොලිස් බැරැක්කය
  වර්ථමානයේ මෙම ගොඩනැගිල්ල පොලිස් බැරැක්කය ලෙසටම භාවිතා කරනු ලැබේ.



- පොලිස් බැරැක්කය යාබද ගොඩනැගිල්ල
ලන්දේසි යුගයේ ඉදි වූ ගොඩනැගිල්ලක් ලෙස හඳුනාගෙන ඇත.වර්ථමානයේ දී පොලිස් බැරැක්කයේම කොටසක් ලෙස භාවිතයට ගනු ලැබේ.



➢ කුඩා තේවතු සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල

රම්පාට් වීදියත් ප්‍රදීපාගාර වීදියත් හමුවන ස්ථානයේ මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත. 19 වන ශත වර්ෂයේ බ්‍රිතාන්‍ය යුගයේ ඉදි වූ ගොඩනැගිල්ලක් ලෙස වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අනුව හඳුනාගෙන ඇත. මෙම ගොඩනැගිල්ල වර්තමානයේ කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලක් වේ.



➢ පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල

මෙම ගොඩනැගිල්ල ලන්දේසි ආණ්ඩුකාරවරයාගේන් නිල නිවස ලෙස භාවිතා කළ බවට ඕලන්ද සිතියම් අධ්‍යනය කිරීමේ දී විද්‍යාමාන වේ. එසේම මෙම ගොඩනැගිල්ල වෙළඳ කළමණාකරණ දෙපාර්තමේන්ව ලෙසත් භාවිතා කරනු ලැබූ බව සඳහන් වේ.(Trade Office / Negotie – Kantoor) වර්ෂ 1750 ගණන්වල මෙම ගොඩනැගිල්ල ප්‍රධාන ලිපිකරු හෝ සහයකයන්ගේ නිල නිවස ලෙස භාවිතා වී ඇත. මෙම ගොඩනැගිල්ලේ යාබඳ කොටස පරිපාලනයේ (Administator) නිවස ඉදිකර තිබුණි. ගාල්ල ටෙලිග්‍රාප් කාර්යාලය ලෙසත් 20 වන ශත වර්ෂයේ මුල් භාගයේ සිට ගාල්ල තැපැල් කන්තෝරු කාර්යාලය ලෙසත් භාවිතා වූයේය.



7.4 වෙනත් ක්‍රියාකාරකම්

- ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා''ජාතික උරුමයන් හා ලංකාවේ ලෝක උරුමයන්'' පිළිබඳ දැනුවත් කිරීමේ දේශන පවත්වන ලදී.

- ගාලු කොටුවේ අනවසර ඡායාරූපගත කිරීම් සංඛ්‍යා 2 ක් නැවැත්වීමට හැකි විය. මෙහි දී ඩ්‍රෝනර් නැමැති කැමරා විශේෂය භාවිතා කිරීම බහුල වශයෙන් සිදු කෙරිණ.

- නාගරික සංවර්ධන අධිකාරියේ නීති රෙගුලාසිවලට පටහැනිව සිදුකරන ලද ගාලු කොටුවේ අනවසර ඉදිකිරීම් 01 ක් වාර්තා කිරීමට හැකි වූ අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කරමින් ඉදිරි පියවරන් ගැනීමට යොමුකර තිබේ.

- ගාලු කොටුව තුළ මාර්ග අවහිර වන ලෙස ගාල් කරන ලද වාහන පොලීසියට වාර්ථා කිරීම් සිදු කිරීම.

- නාගරික සංවර්ධන අධිකාරි පණත අනුව ගාලු කොටුව තුළට වාහන ඇතුළු කිරීම සීමා කිරීම සඳහා උස මීටර් 3ක් සහ ටොන් 5 කට වඩා වැඩි බරින් යුතු වාහන ඇතුලත් කිරීම් නවතා දැමීමට කටයුතු කරන ලදී.

- රාත්‍රී මුර සංචාර පොලීසිය සමඟ ගාලු කොටුව තුළ සිදුවන, අසංවර හැසිරීම් මෙන්ම විනය විරෝධී ක්‍රියා පාලනය සඳහා මැදිහත් වී කටයුතු කරන ලදී.

- අපගේ උපදෙස් මත ආගමන විගමන නිළධාරීන් සමඟ එක්ව කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ගාලු කොටුව තුළ වීසා බලපත්‍ර නොමැතිව රැදිසිටින විදේශිකයින් 05 දෙනෙකු සොයා ගන්නා ලද අතර අදාළ ආයතන ඒ සඳහා ඉදිරි පියවරන් ගැනීමට යොමුකර තිබේ.

- 2019/ 02/16 වන දින ස්වාභාවික ලෝක උරුමයක් වන දෙනියාය සිංහරාජ ප්‍රදේශයේ ඇති පැටිනා නම් සංචාරක ආකර්ශණීය ස්ථානය සඳහා කළමණාකරණ සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් දකුණු පළාත් සංචාරක කාර්යාංශයේ ආරාධනයෙන් එදින පැවැත්වුණු වැඩමුළුව සඳහා සහභාගි වීම.

ගාලු උරුමය පදනම

2019/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

ගාලු උරුමය පදනම

2019.12.31 දිනට

මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2019.12.31 රු.	2018.12.31 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	12	3,345,516.60	1,364,352.20
ස්ථාවර තැන්පතු මත ආදායම	7.2	12,120,065.62	11,040,668.69
කාවකාලිකව රඳවා ගැනීම්		1,027,911.24	929,003.74
ලැබිය යුතු පොලිය	9	435,663.60	180,619.40
ලැබිය යුතු සේවක ණය	10	1,727,243.83	1,540,843.58
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	11	14,500.00	42,498.00
තොග		792,864.74	792,864.74
ලංකා විදුලි පුද්. සමාගමේ තබා ඇති තැන්පතු		1,800.00	1,800.00
බෝතල් තැන්පතු (පානීය ජලය)		7,285.00	7,285.00
සමස්ථ ජංගම වත්කම්		**19,472,850.63**	**15,899,935.35**
ජංගම නොවන වත්කම්			
දේපල පිරියක හා උපකරණ	6	35,004,076.12	33,955,024.22
ආයෝජන	7.1	16,628,634.25	12,000,000.00
අසම්භාව්‍ය වත්කම්		-	1,870,747.18
කෙරීගෙන යන ප්‍රාග්ධන ව්‍යාපෘති	8	16,685,552.71	3,114,218.75
මුළු ජංගම නොවන වත්කම්		**68,318,263.08**	**50,939,990.15**
සමස්ථ මුළු වත්කම්		**87,791,113.71**	**66,839,925.50**
ස්කන්ධ සහ වගකීම්			
ජංගම වගකීම්			
ආපසු ගෙවිය යුතු තැන්පතු (තොග. ම. නවීකරණය කිරීම)		50,000.00	-
උපයන විට ගෙවීම් වගකීම		-	5,000.00
භදුනානාගත් ආදායම		-	100,000.00
ගෙවිය යුතු පුනරාවර්ථන වියදම්		619,479.30	-
ගෙවිය යුතු ප්‍රාග්ධන විදම්		3,393,898.27	-
සමස්ථ ජංගම වගකීම්		**4,063,377.56**	**105,000.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන් කිරීම්		417,378.11	237,044.50
සමස්ථ ජංගම නොවන වගකීම්		**417,378.11**	**237,044.50**
සමස්ථ වගකීම්		**4,480,755.67**	**342,044.50**
ප්‍රාග්ධන හා සංචිත			
දායකත්ව ප්‍රාග්ධන		65,048,789.04	53,566,685.32
අයහාර සංචිත		18,052,768.99	12,722,395.68
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		208,800.00	208,800.00
		83,310,358.03	**66,497,881.00**
සමස්ථ ස්කන්ධ		**83,310,358.03**	**66,497,881.00**
සමස්ථ ස්කන්ධ සහ වගකීම්		**87,791,113.71**	**66,839,925.50**

සභාපති
පරාක්‍රම දහනායක
ගාලු උරුමය පදනම

ගිණුම් නිළධාරි
ඩබ්.ජී.ආර්.අනුරුද්ධ
ගාලු උරුමය පදනම

ගාලු උරුමය පදනම

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2019 රු.	2018 රු.
ආයෘතාර	1	12,282,836.28	8,568,803.00
මෙහෙයුම් මත දළ ආදායම		**12,282,836.28**	**8,568,803.00**
අනෙකුත් ආදායම්	2		
මෙහෙයුම්	2.2	2,091,535.25	2,050,805.00
මෙහෙයුම් නොවන	2.1	2,961,220.54	1,435,609.48
සමස්ථ ශුද්ධ ආදායම		17,335,592.07	12,055,217.48
අඩුකිරීම් - වියදම්			
පරිපාලන	3	(12,075,623.74)	(11,393,443.15)
පුනරාවර්ථන ස්වභාවයේ ප්‍රාග්ධන වියදම් කපා හැරීම්	5	(1,282,896.28)	(861,775.00)
මූල්‍ය	4	(20,963.93)	(23,181.29)
බදු පෙර ලාභය		3,956,108.12	(223,181.96)
වර්ෂය සඳහා බදු		-	-
බදු පසු ලාභය		**3,956,108.12**	**(223,181.96)**
අනෙකුත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා සමස්ථ විස්තීර්ණ ආදායම		**3,956,108.12**	**(223,181.96)**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ජනනය වූ මුදල් ප්‍රවාහය	
ශුද්ධ ලාභය	3,956,108.12
ගැලපීම්	
(+) ක්ෂයසඳහා (සටහන 03)	318,458.10
(+) පාරිතෝෂික (සටහන 03)	180,333.61
(+) බැංකු ගාස්තු (සටහන 04)	725.00
(+) රඳවා ගැනීමේ බදු වියදම (සටහන 04)	20,238.93
(-) පොලී ආදායම (සටහන 02 - 2.1)	
ස්ථාවර තැන්පතු මත පොලී ආදායම	(2,774,441.33)
ඉකිරි කිරීම් ගිණුම් මත පොලී ආදායම	(55,759.29)
සේවක ණය මත පොලී ආදායම	(74,688.42)
(+)පෙර වර්ශයේ ලාභ සංශෝධනයෙන් මුදල් ප්‍රවාහ ගලාඒම්	20,300.00
(-)පෙර වර්ශයේ ලාභ සංශෝධනයෙන් මුදල් ප්‍රවාහ ගලායෑම්	(25,000.00)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්	
ජංගම වත්කම් වල වෙනස්වීම්	
(වැඩිවීම්)/අඩුවීම්	
කාවකාලිකව රඳවා ගැනීම්	(98,907.50)
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන 11)	27,998.00
ජංගම වගකීම් වල වෙනස්වීම්	
(වැඩිවීම්)/අඩුවීම්	
උපයන විට ගෙවිය යුතු වටිනාකම්	(12,000.00)
පුනරාවර්ථන වියදම් ගෙවිය යුතු වටිනාකම්	619,479.30
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,102,844.52**
ආයෝජන ක්‍රියාකාරකම් මත ජනනය වූ මුදල් ප්‍රවාහය	
දේපල පිරියත උපකරණ අත්පත් කර ගැනීම් (සටහන 06)	(1,367,590.00)
ආයෝජන ඉවත්කර ගැනීම් (සටහන 13)	17,168,403.00
වර්ෂය තුල සිදු කරන ලද ආයෝජන (සටහන15)	(20,004,362.30)
පොලී ලැබීම් (සටහන 14)	2,469,225.44
වර්ෂය තුල දරණ ලද ප්‍රාග්ධන වියදම (සටහන17)	(10,006,131.92)
ආයෝජන ක්‍රියාකාරකම් මත ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(11,740,455.78)**
මූල්‍ය ක්‍රියාරකම් මත ජනනය වූ මුදල් ප්‍රවාහය	
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන අරමුදල්	11,482,103.72
මහජන බැංකු ඉකිරිකිරීම් ගිණුමේ අරමුදල් භාවිතයෙන් සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති (සටහන 16)	157,635.87
බැංකු ගාස්තු (සටහන 04)	(725.00)
රඳවා ගැනීමේ බදු වියදමු (සටහන 04)	(20,238.93)
මූල්‍ය ක්‍රියාකාරකම් මත ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**11,618,775.66**
මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම (-) / අඩුවීම (+)	1,981,164.40
වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	1,364,352.20
වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	**3,345,516.60**

ගාලු උරුමය පදනම

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

	දායකත්ව ප්‍රාග්ධනය (රු.)	අයභාර සංචිත (රු.)	වක්කම් ප්‍රත්‍යාගණන සංචිතය	මුළු එකතුව (රු.)
2018.01.01 දිනට ශේෂය	50,922,668.95	11,620,761.40	208,800.00	**62,752,230.35**
ප්‍රවර්ථන වර්ෂයේ අමාත්‍යාංශයෙන් ප්‍රාග්ධන ලැබීම්	2,644,016.37	-	-	**2,644,016.37**
ලාභ / අලාභ	-	(223,181.96)	-	**(223,181.96)**
පුනරාවර්ථන වර්ෂයේ ගැලපීම්	-	1,324,816.24	-	**1,324,816.24**
2019.01.01 දිනට ශේෂය	**53,566,685.32**	**12,722,395.68**	**208,800.00**	**66,497,881.00**
ප්‍රවර්ථන වර්ෂයේ අමාත්‍යාංශයෙන් ප්‍රාග්ධන ලැබීම්	11,482,103.72	-	-	**11,482,103.72**
ලාභ / අලාභ	-	3,956,108.14	-	**3,956,108.14**
පුනරාවර්ථන වර්ෂයේ ගැලපීම්	-	1,374,265.17	-	**1,374,265.17**
2019.12.31 දිනට ශේෂය	**65,048,789.04**	**18,052,768.99**	**208,800.00**	**83,310,358.03**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ

මූල්‍ය ගිණුම්කරණ සටහන්

1. ව්‍යවස්ථාපිත තොරතුරු

1.1 පොදු

ගාලු උරුමය පදනම බුද්ධශාසන,සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ 1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පණත යටතේ, 1994 අප්‍රේල් 26 වන දින ගාලු උරුමය පදනම ස්ථාපනය කරන ලදි. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා තිබෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නො. 12 , රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල යන ස්ථානයේය.

1.2 පදනමේ පරමාර්ථ

අ) ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙස ද පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති

ප්‍රදේශයක් ලෙස ද ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම;

ආ)ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව, ගාලු කොටුව හා එහි පශ්චාත් භූමිය ඇතුළත පිහිටියා වූ ද ඓතිහාසික , සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූ ද යම් නිශ්චල හා චංචල දේපළක් අත්කර ගැනීම්, දැරීම, පවත්වාගෙන යාම සහ බැහැර කිරීම;

ඇ)ගාලු කොටුව හා එහි ඓතිහාසික පසුබිම ඇතුළත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපළ සංරක්ෂණය කිරීමෙහිලා ගාලු කොටුව තුළ පදිංචිකරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම හා එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද එකී කොටුව තුළ පදිංචිකරුවන් අධ්‍යනය කිරීම ද එකී කොටුව සහ ඓතිහාසික පසුබිම තුළ පිහිටා ඇති නිවාස හා ගොඩනැගිලි නැවත තැනීම, අලුත්වැඩියා කිරීම , සංරක්ෂණය කිරීම , තත්වය උසස් කිරීම, යථතත්වයට පත් කිරීම හා ඒ නිවාස හා ගොඩනැගිලි යොදා ගැනීමේ නව ක්‍රම සොයා ගැනීම ;

ඈ)ගාලු කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමියට ඇතුළු වී එහි සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම ;

ඉ)ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය තුළ පදිංචිකරුවන්ගේ සාමාන්‍ය සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම ;

ඊ)ඉහත කී අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

1.3 සේවක සංඛ්‍යාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සේවක සංඛ්‍යාව 13 කි.

2. සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සකස්කොට ඉදිරිපත්කර ඇත.

2.1.2 පිලියෙළ කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී ශ්‍රී ලංකා රුපියල් මගින් ඓතිහාසික පිරිවැය පදනමට පිළියෙල කොට ඇත.

2.1.3 බදුකරණය

මෙම පදනම බුද්ධශාසන,සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් ආදායම් බදු වලින් නිදහස්ය.

2.1.4 මූල්‍ය කාලසීමාව

ගාලු උරුමය පදනම බුද්ධශාසන,සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් පොදු මූල්‍ය වර්ශයක් භාවිතා වේ.

2.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිණුම් පදනම

2.2.1 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැය ලෙස ඒවා මිලදී ගැනීමේ හෝ ඉදිකිරීම් හා බැඳුණු පිරිවැය හඳුනාගෙන ඇත.

ක්ෂය කිරීම

පදනම විසින් දේපල පිරියත සහ උපකරණ ක්ෂය කරනුයේ සරල මාර්ග ක්‍රමයටය. එහි ක්ෂය අනුපාත පහත දක්වා ඇත.

ඉදිකිරීම් හා සුභ සාධන පහසුකම් ස්ථාපිත කිරීමේ ගිණුම	05%
යන්ත්‍ර සුත්‍ර හා පිරියත	20%
ලී බඩු හා සවිකිරීම්	10%
කාර්යාලීය උපකරණ හා වෙනත්	20%

2.2.2 ලැබිය යුතු අගයන්

ලැබිය යුතු අගයන් අදාළ ගණුදෙනු සිදු වූ මොහතේ දීම හඳුනාගනු ලබයි.

කාල සීමාව (මාස)	වෙන් කිරීම් ප්‍රතිශතය
1 - 12	වෙන් කිරීමක් නොමැත.
12 - 36	100 %

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන්

සටහන-01 අයභාර		2019 රු.	2018 රු.
පුනරාවර්ථන වියදම් සඳහා අමාත්‍යාංශයෙන් ලැබීම්		10,999,940.00	8,568,803.00
පුනරාවර්ථන ස්වරූපයෙන් ප්‍රාග්ධන වැය දැරීම්		1,282,896.28	-
දළ අයභාර		12,282,836.28	8,568,803.00
අඩුකිරීම්			
බදු		-	-
ශුද්ධ පිරිවැටුම		12,282,836.28	8,568,803.00

සටහන -02 වෙනත් ආදායම්		2019 රු.	2019 රු.	2018 රු.
මෙහෙයුම් නොවන ආදායම්	සටහන 2.1			
ජා.ඉ.බැ. (ස්.තැ.) මත පොලී ආදායම 2-0003-18-65854		288,506.68		
ලංකා බැංකු(ස්.තැ.) මත පොලී ආදායම 85125046		232,322.52		
ලංකා බැංකු(ස්.තැ.) මත පොලී ආදායම 71618992		86,675.66		
මහජන බැංකුව (ස්.තැ)මත පොලී ආදායම - 013-60-01-00010660-1		183,668.52		
මහජන බැංකුව (ස්.තැ.)මත පොලී ආදායම- 013-60-01-00011869-8		327,061.44	1,371,123.06	
මහජන බැංකුව (ස්.තැ.)මත පොලී ආදායම- 013-60-01-00015793-0		1,421,921.92		
මහජන බැංකුව (ස්.තැ.)මත පොලී ආදායම 013-60-01-00007534-1		234,284.59		
මහජන බැංකුව ඉතිරි කිරීම් මත පොලී		12,545.08		
ලංකා බැංකුව ඉතිරි කිරීම් මත පොලී		222.16		
සේවක පාරිතෝෂික ගිණුම මත පොලී		42,992.05		
සේවක ආපදා ණය මත පොලී		67,534.83	64,486.42	
සේවක මෝටර් සයිකල් ණය මත පොලී		7,153.60		
පරිත්‍යාග ලැබීම්		56,331.50		-
		2,961,220.54		1,435,609.48
මෙහෙයුම් ආදායම්	සටහන 2.2			
කොටුව තුළ ඡායා රූපකරණය සඳහා අවසරපත් ලබා ගැනීම් වෙනුවෙන් ලද ආදායම්		955,500.00		914,800.00
විවිධ ආදායම්		30,664.00		49,475.00
ට්‍රයිටන් යුධ අටවාලයෙන් ලද බදු ආදායම්		1,105,371.25		1,086,530.00
		2,091,535.25		2,050,805.00
මුළු එකතුව		5,052,755.79		3,486,414.48

ගාලු උරුමය පදනම

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන්

සටහන-03 පරිපාලන වියදම්	2019 රු.	2018 රු.
අග්‍රහාර රක්ෂණ	32,000.00	
ක්ෂය	318,458.10	
ආපදා ප්‍රතිපූර්ණය	111,345.50	
විදුලිය සඳහා වියදම්	78,012.48	
සේවක අර්ථ සාධක අරමුදල	523,593.42	
උපකරණ නඩත්තු වියදම්	244,487.52	
සේවක නියුක්තිභාර අරමුදල 03%	130,898.35	
ගාලු කොටුවේ නඩත්තු වියදම්	2,047,875.00	
සභාපතිතුමාගේ ඉන්ධන දීමනා වියදම	453,797.67	
ඉන්ධන වියදම්	350,385.28	
කාර්යාලයේ පවිත්‍රතා වියදම්	480,324.12	
නීති ගාස්තු	48,560.00	
කාර්යාලීය නඩත්තු වියදම්	108,496.87	
වෙනත් වියදම්	43,849.54	
තැපැල් ගාස්තු	22,840.00	
මුද්‍රණ ගාස්තු	101,542.00	11,393,443.15
සංග්‍රහ වියදම්	39,132.00	
සේවක වැටුප්	5,430,600.93	
කළමණාකරණ මණ්ඩල සහභාගීත්ව දීමනා	370,000.00	
පාරිතෝෂික ගෙවීම්	180,333.61	
සේවක අතිකාල දීමනා	162,855.62	
සුබ සාධන	46,131.08	
ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් සහ කාර්යාලී සුළු උපකරණ මිලදී ගැනීම්	196,145.00	
දුරකථන ගාස්තු	168,220.85	
පුහුණු දීමනා	30,500.00	
භාෂා පරිවර්ථක ගාස්තු	58,380.50	
ගමන් වියදම්	41,223.00	
නිළ ඇදුම් දීමනා	8,000.00	
වාහන රක්ෂණ වියදම්	18,636.05	
වාහන නඩත්තු වියදම්	221,590.00	
ජල බිල්පත් ගෙවීම	7,409.25	
මුළු එකතුව	**12,075,623.74**	**11,393,443.15**

සටහන -04 මූල්‍ය පිරිවැය	2019 රු.	2018 රු.
බැංකු ගාස්තු	725.00	-
රඳවා ගැනීම් බදු වියදම්	20,238.93	23,181.29
මුළු එකතුව	**20,963.93**	**23,181.29**

සටහන-05 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රාග්ධන වියදම්	2019 රු.	2018 රු.
වෝගම බල්බ් ප්‍රාග්ධන ව්‍යාපෘතිය	230,930.00	-
බලකොටු අතර දැනුම හුවමාරු ප්‍රාග්ධන ව්‍යාපෘතිය	557,846.28	599,063.50
උරුම දින දර්ශන ප්‍රාග්ධන ව්‍යාපෘතිය	150,000.00	45,082.00
වැඩසටහන් ප්‍රාග්ධන ව්‍යාපෘති	56,770.00	-
සමීක්ෂණ වරඩසටහන් 2019	287,350.00	217,629.50
මුළු එකතුව	**1,282,896.28**	**861,775.00**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

සටහන-6	පිරිවැය				ක්ෂය				2019.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම්	2018.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම්
